ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වත්කම් අපහරණය කිරීම මඟින් උපයාගෙන තිබූ රු.1,856,750 ක ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්විය යුතු වුව ද, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.	පිළිගනිමි. ඉදිරි වර්ෂවලදී ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්වීමට කටයුතු කරන බව.	ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී වත්කම් අපහරණ ආදායම ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්විය යුතුය.

(ආ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රු. 22,550,000 ක වටිනාකමකින් යුතු ට්‍රැක්ටර් 10 ක් සහ ට්‍රැක්ටර් බවුසර් 10 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 ගිණුම් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුලත් කිරීමට කටයුතු කරන බව.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියලු වත්කම් ගිණුම්ගත කිරීමට වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.
(ii)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ලක වටිනාකම රු.1,759,179 ක් 9151 සංකේත අංකය යටතේ ගොඩනැගිලි ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	පැවති ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ඇති අතර, නැවත තක්සේරු කොට එම අගය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ වටිනාකම ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කළ යුතුය.

(iii)	තණමල්විල සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ගොඩනැගිලි 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ගොඩනැගිලි තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව.	ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(iv)	2013 වර්ෂයේදී තක්සේරු කරන ලද මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.5,251,000 ක් වටිනා ගොඩනැගිලි 05ක් විගණිත දිනය වූ 2025 මාර්තු 17 දින වන විට අබලන් තත්ත්වයට පත්වී අතහැර දමා තිබුණි. එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් නොකිරීම නිසා මූල්‍ය නොවන වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	ගොඩනැගිලි නැවත තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව.	අබලන් තත්ත්වයේ පවතින ප්‍රයෝජනයට නොගන්නා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කළ යුතුය.
(v)	ජාතික ආපදා කළමනාකරණ ඒකකයට අයත් රු.7,200,000ක් වටිනා මෝටර් ලොරි රථයක් සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.400,000 ක් වටිනා ජල බවුසරයක් වාහන යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.7,600,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ලොරි රථය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ උපදෙස් අනුව වත්කම් වලින් ඉවත් කිරීමට සහ ජල බවුසර් රථය භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බැවින් පවරාගෙන විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කරන බව.	විධිමත් පරිදි කටයුතු කර වෙනත් ආයතනවලට අයත් වාහන ආපසු භාර දීමට හෝ පවරා ගැනීමට කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කළ යුතුය.
(vi)	ඉදි කිරීම් අවසන් වී නොමැති බිබිල හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි දෙකෙහි රු.411,869,721 ක වියදම කෙරීගෙන යන වැඩ -9160 යටතේ ගිණුම්ගත කල යුතු වුව ද, 9151- ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීම නිසා ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	නව ගොඩනැගිලි ඉදිකිරීමේ දී කෙරීගෙන යන වැඩ - 9160 කේතය යටතේ ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ හැකි තත්ත්වයේ නොමැති නොනිම් ගොඩනැගිලි වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතු ය.
(vii)	වැය ලෙජරය අනුව බිබිල හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීමට අදාලව සමාලෝචිත වර්ෂයේ රු.190,478,990 ක වියදම භාණ්ඩාගාර මුද්‍රිත SA 82 හි රු.36,148,836 ක් මිල දී ගැනීම් යටතේ සහ ඉතිරි රු.154,330,154 ක් ආරම්භක ශේෂයට ගැලපීම් යටතේ සදොස් ලෙස ස්ථාන දෙකක ගිණුම්ගත කර තිබුණි.	සිගාස් පද්ධතියට ඇතුලත් කිරීමේදී ප්‍රමාද දෝෂයකින් මිලදී ගැනීම් යටතේ ඇතුලත් කර ඇති අතර, එය නිවැරදි කිරීම සඳහා මිලදී ගැනීම් ඉවත් කර එම වටිනාකම ආරම්භක ශේෂයට එකතුකර ඇති බව.	ඉදිරියේදී සමාලෝචිත වර්ෂය තුල දරන ලද වියදම එම වර්ෂයේ නිවැරදි ගිණුම් තුළ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) වෙනත් අඩුපාඩු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය ව්‍යාපෘතියට අදාලව 2015 වර්ෂයේ දී ප්‍රතිලාභියෙකු වෙත රු.850,000 ක් වැඩිපුර වන්දි ගෙවීම මත සිදුව තිබූ පාඩුව හානි පාඩු ලේඛනයේ සටහන් කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	මේ සම්බන්ධව පරීක්ෂාවක් සිදු කර ඉදිරි කටයුතු කරන බව	හානි හා පාඩු නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර, ඒවා විධිමත් පරිදි කටයුතු කර අයකර ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා දී තිබූ ප්‍රතිපාදනවලින් වැය විෂයයන් 18 කට අදාළව රු.76,402,788 ක් ඉතිරි වී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 10 සිට සියයට 52 දක්වා පරාසයක විය.	ඉදිරි වර්ෂවලදී අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයට පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව.	ප්‍රතිපාදන ඌන උපයෝජනයට වැඩපිළිවෙලක් සැකසීමත්, ප්‍රතිපාදන ඉතිරිවීම් අවම වන පරිදි අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමත් කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂය තුළ 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂයය සඳහා රු.250,000,000 ක ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24ක් ලෙස රු.59,521,009 ක් වී තිබුණි. බිබිල සහ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණ ද එම ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය තුල දී ද නිම කිරීමට නොහැකි වී තිබුණි. නිසි කළමනාකරණයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා භාවිතයට නොගැනීම මත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය.	2025 වර්ෂය සඳහා අවිච්ඡේද කොට ඇති අතර 2025 වර්ෂය තුලදී මෙම කාර්යය අවසන් කිරීමට කටයුතු කරන බව.	ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා වෙන්කල ප්‍රතිපාදන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් නිම කිරීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය නොකිරීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන තුළ ඇමුණුම් (iv) යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) හි මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව එළඹ තිබූ සියලු බැඳීම් හෙළිදරව් කළ යුතු වුව ද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බැරකම් ලේඛනයේ ඇතුළත් කර තිබූ වැය විෂයයන් 03කට අයත් රු.549,133 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයන්හිදී මූල්‍ය ප්‍රකාශන තුල බැරකම් නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කරන බව.	ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට වර්ෂයට අදාල සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් වන බව තහවුරු වන පරිදි අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය සංවර්ධන ව්‍යාපෘතියට ඉඩම් අත්පත්කර ගැනීම් සහ වන්දි ගෙවීම් වලට අදාලව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	(i) ඉඩම් කට්ටි 552 ක් සඳහා රු.477,309,806 ක වන්දි මුදල් ගෙවා තිබුණි. 2012 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් වන්දි ගෙවීම් වසර 12 ක් ප්‍රමාද වීම හේතුවෙන් ඉඩම් කට්ටි 243 ක් වෙනුවෙන් රු.33,518,353 ක අමතර පොලී මුදලක් ගෙවීමට සිදු වි තිබුණි.	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා විවිධ ආයතන සම්බන්ධ වන බැවින් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා විශාල කාල පරාසයක් ගත වී ඇත. ඉදිරි වන්දි ගෙවීමේ කටයුතු කිරීමේ දී	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවයක් මත සිදු වී ඇත්නම් එම නිලධාරීන්ට විධිමත් පරිදි කටයුතු කිරීමත්, ඉඩම්

		අදාළ ආයතන දැනුවත් කර කඩිනමින් මෙම කාර්ය නිම කිරීමට බලාපොරොත්තු වන බව.	අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතර පොලී මුදල් ගෙවීම නවතා ගැනීමටත් පියවර ගත යුතුය.
(ii)	ඉඩම් කැබලි 04ක් සඳහා වන්දි ඉල්ලීමේදී ඉඩම් හිමියන් විසින් පැරණි ඔප්පු හා පත්ඉරු ලබාදීම හේතුවෙන් සින්නක්කර අයිතියට හිමි අගයන් තක්සේරු කර තිබුණි. මිනින්දෝරු වාර්තා අනුව ඒවා රජයේ ඉඩම් ලෙස සනාථ වීමත් සමඟ රු.11,710,500 ක් වූ මුල් වන්දි මුදල, සංවර්ධන වටිනාකම දක්වා අඩු වටිනාකමකට තක්සේරු කිරීම හේතුවෙන් වන්දි ගෙවීම් වෙනුවෙන් ලද එම මුදල් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. වගකිව යුතු නිලධාරීන් විසින් එම ඉඩම්වල අයිතිය නිවැරදිව සනාථ කර ගැනීමට කටයුතු නොකිරීම මත වන්දි ගෙවීම් කටයුතු තවදුරටත් ප්‍රමාද වී තිබුණි.	වන්දි මුදල් ගෙවීමට පෙර එම ඉඩම් රජයේ ඉඩම් බවට තහවුරු වීම හේතුවෙන් වන්දි ගෙවීම තාවකාලිකව නතර කරන ලදි. එම වරද නිවැරදි කර ගැනීමේ දී පෙර තක්සේරු වටිනාකම සංවර්ධන තක්සේරු වටිනාකමක් ලෙස ලබා දී ඇත. ඉඩම් හිමියන්ට ලැබෙන වන්දි මුදල අඩු වීම හේතුවෙන් ඉඩම් අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති අතර එම තීරණ ලැබෙන තෙක් තක්සේරු මුදල තැන්පත් ගිණුමේ රඳවා ඇති බව.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා ඉඩම්වල අයිතිය නිවැරදිව තහවුරු කරගෙන අදාළ පාර්ශව වෙත වන්දි ගෙවීමට කටයුතු කළ යුතුය.
(iii)	හඳපානාගල ජලාශය වැඩිදියුණු කිරීම සඳහා අත්පත්කර ගන්නා ලද ඉඩම් කැබල්ලක පිහිටි නිවස ඉවත් කර නොගැනීම හේතුවෙන් රු.1,474,975 ක් 2024 පෙබරවාරි 08 දින සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.	නිවස කඩා ඉවත් කර ගැනීම සඳහා තක්සේරු කරන ලද මුදලින් මූලිකව 75% ක් ගෙවා ඇති අතර නිවාස හිමියා විසින් මෙම නිවස කඩා ඉවත් කිරීම ප්‍රමාද කරන බැවින්, ඉතිරි 25% මුදල තැන්පත් ගිණුමේ රඳවා ඇත. නිවාස හිමියා වෙත සන්තකය ලබා ගැනීමේ පනත යටතේ අස්කිරීමේ දැන්වීම් යොමු කර ඇත. ඉදිරියේදී අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා වන්දි මුදල් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.
(iv)	ඉඩම් අත්පත්කර ගැනීම 2012 වර්ෂයේ දී ආරම්භ කර, වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි 705 ක් හඳුනාගෙන තිබුණද, 2025 මාර්තු 21 දින වන විටත් ඉඩම් කට්ටි 95 ක් සඳහා වන්දි ගෙවා නොතිබුණි.	තක්සේරු වාර්තා හා අනෙකුත් ගැටළු විසඳා ගැනීමෙන් අනතුරුව වන්දි මුදල් ගෙවා අවසන් කිරීමට අපේක්ෂා කරන බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි සඳහා කඩිනමින් වන්දි ගෙවීමට පියවර ගත යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් ග්‍රාම ශක්ති සමිති 33 ක රු. 27,232,480 ක් 2018 වර්ෂයේ සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුනි.	බුත්තල - සක්‍රීය මට්ටමේ පවතින ග්‍රාම ශක්ති සමිතිවල එකභතාවය මත හඳුනාගෙන ඇති ප්‍රජා සංවර්ධන අවශ්‍යතා 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. මඩුල්ල - අරමුදල් රජයට පවරා ගන්නා ලෙස ලිඛිතව දැන්වූ සමිති 03 කට අදාල රු.1,511,077 ක් රජයට පවරා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට සෞභාග්‍යා සංවර්ධන කාර්යංශ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. ඉතිරි සමිති 04 සක්‍රීයව පවත්වා ගෙන යන්නේද යන්න වසම් භාර ආර්ථික නිළධාරීන්ගෙන් විමසා ඇති බව. බඩල්කුඹුර - සමිති 03 ක ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් ක්‍රියාත්මක වන අතර ඉතිරි සමිති 09 සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. වැල්ලවාය - එක් සමිතියක මුදල් අයකරගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාල පොදු තැන්පත් ගිණුමට තැන්පත් කර ඇති අතර ඉතිරි සමිති දෙකෙන් අයකර ගත යුතු රු.3,011,381 ක මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	අක්‍රීය සමිති ක්‍රියාකාරී තත්තවයට පත් කිරීමට හෝ විධිමත් පරිදි කටයුතු කර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	බඩල්කුඹුර, මඩුල්ල සහ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් 22ක් වෙත වැඩිපුර ගෙවා තිබූ විශ්‍රාම වැටුප් රු.2,642,756 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණි.	වැඩිපුර ගෙවන ලද මුදල මාසිකව අයකරමින් පවතින බව.	වැඩිපුර ගෙවීමට අදාළ විධිමත් පරීක්ෂාවක් කිරීමටත්, වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව අයකර ගැනීමටත්, කටයුතු කළ යුතුය.

(ඈ)	අස්වැසුම ප්‍රතිලාභීන් 05 දෙනෙකු මිය යාමෙන් පසුව ප්‍රතිලාභ ගෙවීම් නතර කිරීම මාස 03 සිට 16ක් දක්වා ප්‍රමාදවීම හේතුවෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.198,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	2024 ඔක්තෝම්බර් මාසයෙන් පසුව වසම්භාර නිලධාරීන් විසින් මියගිය පුද්ගලයින් පිළිබඳ තොරතුරු නිසි පරිදි වාර්තා කරන අතර ඉදිරියේ දී මෙවැනි අතපසු වීම් නොවීමට කටයුතු කරන බව.	පරීක්ෂණයක් පවත්වා විධිමත් පරිදි කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, වැඩිපුර ගෙවා තිබූ අස්වැසුම ප්‍රතිලාභ ආපසු අයකර ගැනීමත් කළ යුතුය.
(ඉ)	කාන්තා කාර්යාංශයේ චක්‍රීය ණය වැඩසටහන යටතේ බඩල්කුඹුර , මඩුල්ල සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් 436 ක ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,422,218 ක් අයවීමට තිබුණි.	බඩල්කුඹුර - අයකර ගැනීම සඳහා වනිතා සංවර්ධන නිලධාරීන් විසින් අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. මඩුල්ල - ණය මුදල් වාරික වශයෙන් අය වෙමින් පවතින බව. වැල්ලවාය - ණය ගෙවීම් කඩිනම් කරන ලෙස දැනුවත් කිරීම් සිදු කරනු ලබන බව.	කාලීනව ණය අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, හිඟ ණය ශේෂයන් ආපසු අය කර ගැනීම කාර්යක්ෂම කිරීමත් කළ යුතුය.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී මෙම වාර්තාවල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය අනුව කටයුතු කල යුතුය.

(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය අනුව කටයුතු කල යුතුය.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

		නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය	-	2025 ජනවාරි 30 දින වන විට ගිවිසුම් කාල සීමාව අවසන් වී තිබූ රජයේ නිවාස 07 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ආපසු පවරා නොගැනීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2024 දක්වා පොරොත්තු ලේඛනයේ සිටින සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට රජයේ නිවසක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	නිවාස 05ක් සේවා අවශ්‍යතාවයන් මත කාලය දීර්ඝ කර දී ඇති අතර, 02ක් නැවත භාර දෙන ලෙස අදාළ නිලධාරීන් හට දන්වා ඇති බව.	විධිවිධාන පරිදි කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව පියවරක් ගැනීමත්, ගිවිසුම් කාලය අවසන් වී ඇති නිවාස පවරාගෙන පොරොත්තු ලේඛනය අනුව ඉල්ලුම්කරුවන්ට ලබාදීමත් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
(i)	මුදල් රෙගුලාසි 94(2)	989,327	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සීමාව ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.	ඉදිරියේදී වියදම් අවම කර ගැනීමට කටයුතු කරන බව.	ඉදිරියේදී වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන් කල ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹෙන බව තහවුරු වන වැඩපිළිවෙලක් සැකසිය යුතුය.

(ii)	මුදල් රෙගුලාසි 104 (3)	-	ට්‍රැක්ටර් රථ දෙකක බැටරි දෙකක් 2023 සැප්තැම්බර් 01 දින අස්ථානගත වී තිබුණි. පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද, විගණිත දිනය වූ 2025 මාර්තු 17 දින වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. තවද, 2023 අගෝස්තු 23 දින වාහනයකට සිදු වූ අනතුරක් සම්බන්ධයෙන් 2023 ඔක්තෝබර් 30 දින පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද, 2025 ජනවාරි 30 දින වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	පරීක්ෂණ මණ්ඩලය වෙත සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ලබා ගෙන ඉදිරි කටයුතු නිම කළ යුතුය.
(iii)	මුදල් රෙගුලාසි 104 (4)	-	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 සිට 2024 දක්වා වාර්තා වූ වාහන අනතුරු 05ක් සම්බන්ධයෙන්, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 2020 නොවැම්බර් මස 11 වන දින අනතුරට පත් කැබ්රථයක් හා අකුණු සැර වැදීම හේතුවෙන් 2023 ඔක්තොම්බර් 17 වන දින මොනරාගල ප්‍රාදේශීය ලේකම් නිල කාමරයට හානි සිදුවීම සම්බන්ධයෙන් 2025 ජනවාරි 30 දින වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.	වාහන 03ක් සඳහා ඉදිරියේදී කමිටුවක් පත් කර වාර්තා ලබා ගැනීමට අපේක්ෂිත බව. වාහන 02ක් සඳහා වාර්තාව කඩිනමින් ලබා දෙන ලෙසට සිහිකැඳවීම් ලිපි යොමු කරන ලද බව හා පරීක්ෂණ මණ්ඩලය වෙත සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව.	- එම -
(iv)	මුදල් රෙගුලාසි 128 (1) (ඉ)	-	2023 වර්ෂයට අදාලව මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයේ භාණ්ඩ වර්ග 13 කට අයත් ඒකක 28 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාණ්ඩ වර්ග 02කට අයත් ඒකක 31 ක ඌනතාවයක් පවතින බවට වාර්තා කර තිබුණු අතර භාණ්ඩ නැතිවීම	ප්‍රාදේශීය ලේකම්වරයෙකු නිල නිවාසය හා භාණ්ඩ විධිමත්ම භාරදීමකින් තොරව යතුර පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවා ඇත. හිඟ භාණ්ඩ පිළිබඳව ඔහු දැනුවත් කර ඇති නමුත් ඒ සඳහා ප්‍රතිචාර දක්වා	විධිමත් පරිදි කටයුතු කර භාණ්ඩ ඌනතා සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සිදුව ඇති පාඩුව අයකර ගත යුතුය.

			සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හදුනාගෙන වටිනාකම අයකර ගැනීමටත්, ඌනතාවයට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි.	නොමැති බව.	
(ඇ)	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2020 මැයි 20 දිනැති අංක 2020/6 චක්‍රලේඛයේ 1.1 ඡේදය	25,680,769	වාර්ෂික බදු මුදල කාර්තුමය පදනමින් අයකල යුතු වුවද දීර්ඝ කාලීන බදු බලපත්‍ර 03ක් සම්බන්ධයෙන් බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම නිර්දේශය අනුව කටයුතු කර නොතිබුණු අතර 2024 සැප්තැම්බර් 30 දිනට බදු ආදායම් හිඟහිටිව පැවතුණි.	බදුකර දෙකක හිඟ බදු ගෙවීමට බදුකරුවන් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් සහන කාලයක් ඉල්ලා ඇත. එක් බදුකරුවෙකු මිය ගොස් ඇති බැවින් හිඟ බදු කපා හැරීමට ඉල්ලීම් කර ඇති බව.	කාලීනව හිඟ බදු අයකිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, රජයට ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

3.6 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බඩල්කුඹුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අලුපොත භූගත ජල ටාංකය ඉදිකිරීම සඳහා අත්කර ගැනීම වෙනුවෙන් ඉඩම් කොටසක්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරාගැනීමට 2020 දෙසැම්බර් 11 දින රු.200,000 ක මුදලක් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 18 වන විට එම මුදල තැන්පත් කර වසර 04 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, ඉඩම පවරා දීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	රු.16,200 ක මුදලක් මැනුම් ගාස්තු වශයෙන් වියදම් වී ඇත. රු. 183,800 ක මුදලක් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන ඇති අතර ඉතිරි මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට යොමු කිරීමට කටයුතු කරන බව.	ඉඩම පවරාදීම කඩිනම් කර තැන්පත් මුදල් නිරවුල් කල යුතු ය.
(ආ)	විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ උපකාරක ව්‍යාපෘතිය (SESRIP – Package 04) යටතේ යෝජිත වැල්ලවාය චොට් 33 අධිසැර විදුලිය බෙදාහැරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ලැබී තිබුණු රු. 700,000 ක් 2019 අගෝස්තු 29 වන දින සිට වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල තැන්පත් ගිණුමේ රඳවා තිබුණු අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබුණි.	ඉඩම අත්කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, ඉතිරි මුදල විදුලිබල මණ්ඩලය වෙත යැවීම සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කරන බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර ප්‍රමාදවීමට හේතු හඳුනාගෙන ඊට අදාළ පිළියම් යොදා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු ය.

(ඈ)	කොළඹොරේ ජල පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අදාල වියදම් සඳහා 2021 පෙබරවාරි 05 දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ රු.180,617 ක් අදාල කාර්යය ඉටුනොකිරීම මත වසර 04 කට අධික කාලයක් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.	06 වන වගන්තිය යටතේ මූලික පිඹුර සකස් කිරීම සඳහා මැනුම් ගාස්තු රු.53,808ක් සර්වේයර් ජනරාල් වෙත යොමු කර ඇති අතර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතින බව.	- එම -

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගංවතුර, නායයෑම් හා නායයෑම් අධි අවදානම් සහිත තැනැත්තන් නැවත පදිංචි කිරීම යටතේ ඉඩම් මිලදී ගෙන නිවසක් ඉදිකර ගැනීම සඳහා 2021 වර්ෂයේ ප්‍රතිලාභියෙකුට රු.1,300,000 ක් ගෙවා තිබුණි. විගණන දිනය වූ 2024 නොවැම්බර් 08 දින වන විටත් ප්‍රතිලාභියා විසින් නිවස ඉදිකර නොතිබුණි.	ප්‍රතිලාභියා වෙත ගෙවන ලද රු.1,300,000 ක මුදල නීති මාර්ගයෙන් නැවත අයකර ගැනීම සඳහා උපදෙස් ඉල්ලමින් නීතිපති වෙත ලිපියක් යොමු කර ඇති බව.	විධිමත් පසු විපරමක් සිදු කර නිවාසය ඉදි කිරීම හෝ ඉදි කිරීම් කටයුතු නොකරන්නේ නම් ගෙවන ලද මුදල් ආපසු අය කර ගැනීමට කටයුතු කල යුතු ය.

4.2 **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ අනුව පනත් හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සකසා ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තාවේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආපදා කළමනාකරණ ඒකකයේ කාර්යසාධනය විශේෂිත දර්ශක 07 ක් යටතේ සියයට සියයක් ලෙස සඳහන්ව තිබුණද, ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියක් ලෙස 2024 මැයි 20 දින ආරම්භ කර තිබුණු පුවක්පිටිය වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දිනට	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.	කාර්යසාධනය වාර්තා කිරීමේදී නිවැරදි නොවූ තොරතුරු ඇතුළත් කළ නිලධාරීන්ට පියවර ගැනීමත්, ඉදිරියේදී කාර්යසාධන වාර්තාව නිවැරදි සහ සත්‍ය

	අවසන් කර නොතිබුණි. 2025 පෙබරවාරි මාසයේ ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 0.25 ක් සහ භෞතික ප්‍රගතිය සියයට 25 ක් පමණ වී තිබුණි.		තොරතුරු ඇතුලත් කර සකස් කිරීමට පියවර ගැනීමත් කළ යුතු ය.
(ආ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවේ විදාතා සංවර්ධන කටයුතු ඇගයීමට පිහිටුවා තිබූ විශේෂිත දර්ශක 10 හි කාර්යසාධන මට්ටම සියයට සියයක් ලෙස දක්වා තිබුණි. විදාතා සංවර්ධන අංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව ව්‍යවසායකත්වය සංවර්ධන හා තාක්ෂණ හුවමාරු පුහුණු වැඩසටහන්, විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, තාක්ෂණික සත්කාර සේවා වැඩසටහන් සහ ග්‍රාමීය නිෂ්පාදන සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා හා ප්‍රමිති සහතික ලබාදීම යන වගකීම් ක්ෂේත්‍රයන්හි වාර්ෂික ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිවෙළින් 67% , 43% , 86% ක් සහ 38% ක් වී තිබුණි.	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.	- එම -
(ඇ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ආපදා සහන සේවා කටයුතුවල කාර්යසාධනය ඇගයීම් යටතේ අනාරක්ෂිත බව අවම කිරීම යන දර්ශකයේ කාර්යසාධනය සියයට සියයක් ලෙස දක්වා තිබුණද, ආපදා සහන සේවා අංශයේ වාර්ෂික ප්‍රගති වාර්තා අනුව එවැනි ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.	- එම -
(ඈ)	ආපදා සහන සේවා අංශයේ නැවත පදිංචි කිරීම සඳහා වන දර්ශකයේ කාර්යසාධනය සියයට සියයක් ලෙස දක්වා තිබුණද, එම අංශයෙන් ඉදිරිපත් වූ ප්‍රගති වාර්තාව අනුව වර්ෂය තුළ ලැබූ ප්‍රතිපාදන බෙදා හැරීමේ මූල්‍ය ප්‍රගතිය හැර භෞතික ප්‍රගතිය ඇගයීමට ලක්කර නොතිබුණි. මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැවත පදිංචි කිරීම් සඳහා ප්‍රතිපාදන ලබාදුන් ප්‍රතිලාභීන් දෙදෙනෙකුගේ නිවාස ඉදිකිරීම් අවසන් ව නොතිබිය දී කාර්යසාධනය සියයට සියයක් බව දැක්වීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.	- එම -

4.3 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීමත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සහල් වෙළඳපල මිල ගණන් සමීක්ෂණය කර සහල් මිලදී ගැනීමට කටයුතු නොකිරීමත්, මුදල් රෙගුලාසි 156 (7) ප්‍රකාරව රජයට වාසිදායක පරිදි කටයුතු නොකිරීමත්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 අප්‍රේල් 04 දිනැති අංක DFD/2024-01 දරන චක්‍රලේඛයේ 3.6 ඡේදයේ දක්වා ඇති පරිදි රජයේ වියදම් අවම වන ආකාරයට කටයුතු නොකිරීමත්, 2024 අප්‍රේල් 10 හා 2024 ජුනි 10 දිනැති ප්‍රතිපාදන අනුමත කිරීමේ ලිපිවල අංක 04 ඡේදයේ සඳහන් පරිදි වියදම් දැරීමේදී රජයේ නිතීරීති වලට අනුව කටයුතු නොකිරීමත් නිසා මොනරාගල දිස්ත්‍රික්කය තුල සහල් මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් රජයට රු. 36,649,480 ක පාඩුවක් සිදුව තිබුණි.	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් සහල් මිල දී ගැනීමේ සහතික මිල තීරණය කර ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම හා මුදල් අවභාවිතයක් හෝ දූෂණයක් සිදු වී ඇති බව පෙනී යන්නේ නම් නීතිය බලාත්මක කරන ආයතනයක් වෙත යොමු කිරීමත් කළ යුතුය.
(ආ)	මුදල් රෙගුලාසි 156 (7) ප්‍රකාරව රජයට වාසිදායක පරිදි කටයුතු නොකර සහ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 අප්‍රේල් 04 දිනැති අංක DFD/2024-01 දරන චක්‍රලේඛයේ 3.6 ඡේදය අනුව රජයේ වියදම් අවම වන පරිදි අඩු මිලක් සහිත රතු කැකුළු සහල් මිලදී ගැනීමට කටයුතු නොකර වැඩි මිලක් සහිත සුදු කැකුළු සහල් මිලදී ගැනීම නිසා මැදගම සහ සියඹලාණ්ඩුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.957,870 ක පාඩුවක් රජයට සිදු කර තිබුණි.	අඩු ආදායම්ලාභී පවුල් සඳහා අවශ්‍යා සම්පූර්ණ සහල් එකම වර්ගයකින් ලබාදීමට තරම් ප්‍රමාණවත් වී තොග නොමැති බැවින් වර්ග දෙකෙන්ම සහල් ලබා දීමට සිදු වූ අතර දෙවන අදියරේදී සුදු සහල් ලබා ගැනීමට සිදුවූයේ සැපයුම්කරුවන් සතුව රතු සහල් නොමැති වීම නිසා බව.	- එම -

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ගබඩාව තුල තිබූ පිත්තල ජල කරාම 60 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර තිබුණ ද ඒවා ලැබුණේ කාගෙන් ද හෝ කුමන කටයුත්තක් සඳහා මිල දී ගත් ඒවා ද යන්න සහ ඒවායේ වටිනාකම හඳුනාගෙන නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් මිලදී ගත් බවට තොරතුරක් ලබාගත නොහැකි වූ අතර දීර්ඝ කාලයක් තිස්සේ ගබඩාව තුළ පැවතී ඇත. 2023 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂණයට යොමුවූ බැවින් අදාළ භාණ්ඩ තොග පොතට ඇතුළත් කර ඇත.	ගබඩාවේ පවතින භාණ්ඩ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලේඛනගත කර පවත්වාගෙන යා යුතු අතර ජල කරාම ඵලදායී කාර්යයකට යොදා ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ආ)	ලෝක ආහාර වැඩසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ජීප් රථයක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණ ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරාගෙන නොතිබුණි.	ලෝක ආහාර වැඩසටහන විසින් පරිත්‍යාග කරනු ලැබූ වාහන පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර ඒ සමඟ MTA 6 හා MTA8 ආකෘති පත්‍රද යොමු කොට ඇති බව.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගනු ලබන වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතු ය.

4.5 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය ව්‍යාපෘතියට අදාලව 2015 වර්ෂයේ දී ප්‍රතිලාභියෙකු වෙත රු.850,000 ක් වැඩිපුර ගෙවීම මත සිදුව තිබූ පාඩුව, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් බෙදා දීමේ වැඩසටහන අතරතුර දී සිදු වී තිබූ රු.68,008 ක අලාභය සහ 2023 වර්ෂයේ දී මොනරාගල අංක 2 දරන සංචාරක බංගලාව සොරුන් කැඩීම හේතුවෙන් සිදු වී තිබූ රු. 54,519 ක පාඩුව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර නොතිබුණි.	වැල්ලවාය - 2015 වර්ෂයේ සිදු වූ සිදුවීමක් වන අතර, ඉදිරියේදී මේ සම්බන්ධව පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව කටයුතු කරන බව. සෙවනගල - ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි මෙම අලාභය ඇතුලත් කිරීමට කටයුතු කරන බව. සංචාරක බංගලාව - රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් විමසීම් කොට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරන බව.	සියලුම පාඩු හා හානි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමත්, සියලුම පාඩු හා හානි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමටත් පියවර ගත යුතුය.

(ආ)	අනතුරට පත් වාහන 02 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා අනුව හඳුනාගෙන තිබූ රු.208,524 ක අලාභය මූල්‍ය ප්‍රකාශන තුල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.	මෙම වාහන අනතුරු 02කට අදාළ අලාභයන් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීම අතපසුවීමකින් මගහැරී ඇති අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන සකස් කිරීමේදි ඇතුලත් කිරීමට කටයුතු සිදු කරන බව.	- එම -

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 03 ක් සඳහා 2025 මැයි 23 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

4.7 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාල තක්සේරු වාර්තාව අනුව රජයේ නිවාස සඳහා තක්සේරු කුලී අය නොකිරීම මත 2024 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.291,900 ක මුදලක් අදාල නිලධාරීන් විශ්‍රාම යාම හා ස්ථානමාරු ලැබීම යන කරුණු මත ක්‍රමවත්ව අය නොවන බව නිරීක්ෂණය විය.	2025 මාර්තු 18 දිනට රු.26,663 ක මුදලක් රජයට අය වී ඇති බව.	විධිමත් පරිදි කටයුතු කර කාලීනව නිවැරදි නිවාස කුලිය අය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමටත්, හිඟ නිවාස කුලී මුදල් කඩිනමින් අය කිරීමටත් කටයුතු කළ යුතු ය.
(ආ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කාන්තා හා පිරිමි සාද නිවාස සහ නිල සෙවන නිවාස 2කින් 2024 වර්ෂය සඳහා අයවිය යුතු රු.297,143 ක කුලී මුදලක් අදාල නිලධාරීන්ගෙන් අය කරගෙන නොතිබුණි.	රු.141,437 ක මුදලක් අය වී ඇති බව.	- එම -
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුලදී වන අලි ඇතුළු වන සතුන්ගෙන් දේපල හානි 528 ක් ද, ශාරීරික හානි 32 ක් හා ජීවිත හානි 30 ක් වාර්තා වී තිබූ අතර ඒ සඳහා රු.52,619,280 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. වැල්ලවාය හා තණමල්විල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු වී ඇති දේපළ, ශාරීරික හා ජීවිත හානි ප්‍රමාණය සාපේක්ෂව ඉහල අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සැලසුම් සකස් කිරීමේදී,	වන සතුන්ගෙන් වන හානි සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව රැස්වීම් 11ක් පවත්වා ඇති අතර මෙම තත්වය වැලැක්වීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව.	වන සතුන්ගෙන් සිදු වන හානි අවම කිරීම සඳහා විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කල යුතුය.

	මෙම ගැටළුව විසඳීම සම්බන්ධයෙන් අදාල ආයතන සමඟ ඒකාබද්ධ වී ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට කඩිනමින් කටයුතු කළ බව විගණනයට නිරීක්ෂණය නොවීය.		
(ඇ)	මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් වැඩිහිටි හා ආයතනගත නේවාසික දීමනා, අබාධිත දීමනා, වකුගඩු දීමනා, අස්වැසුම සහ සියවස් පූර්ණ දීමනා යටතේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කට අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දීම සඳහා රු.951,198,069 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එයින් රු.30,727,337 ක් වූ ප්‍රතිපාදන නිසි අධ්‍යානයකින් තොරව ලබා ගැනීම සහ සුදුසු ප්‍රතිලාභීන් තෝරා නොගැනීම හේතුවෙන් ආපසු පවරාදී තිබුණි.	2024 වර්ෂයේ අවසන් කාර්තුවේදී පොරොත්තු ලේඛනයට නැවත ප්‍රතිලාභීන් ඇතුලත් කිරීම තාවකාලිකව නතර කරන ලදී. ඒ හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වූ අතර ඉදිරියේදි විධිමත්ව හා කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කිරීමට කටයුතු කරන බව.	නීතිමය විධිවිධාන පරිදි අරමුණුගත කාර්යය සඳහා ප්‍රතිපාදන උපයෝජනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, ලබා දී ඇති ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව ප්‍රයෝජනයට ගත හැකි වැඩපිළිවෙලක් සැකසීමටත් පියවර ගත යුතුය.
(ඉ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මධ්‍යම පාන්තික ගැණුම් මිල මත ඉඩම් බලපත්‍ර නිකුත් කල ප්‍රතිලාභීන් 04 දෙනෙකුගෙන් වාරික හා හිඟ පොලිය වශයෙන් රු.365,920ක් විගණන දිනය වූ 2024 නොවැම්බර් 30 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ මුදල් අයකරගැනීම සඳහා නැවත සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති බව.	කාලීනව වාරික හා පොලී අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව කටයුතු කිරීමටත්, හිඟ වාරික හා පොලී මුදල් කඩිනමින් අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(ඊ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු පදනම මත 2019 ඔක්තෝබර් 11 දින බලපත්‍ර අංක 4/10/5700 යටතේ රජයේ ඉඩමක් බදු දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අයවිය යුතු හිඟ බදු මුදල රු.1,960,000 ක් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 29 දින වන විටත් අයකරගැනිමට කටයුතු කර නොතිබුණි.	2020 ඔක්තෝබර් 08 දින බදුකරු අනතුරට ලක්වී කරගෙන ගිය ව්‍යාපාරය වැසී ගොස් අදායම් මාර්ග නොමැති බැවින් බදු මුදල් ගෙවීමට නොහැකි බවට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව.	- එම -
(උ)	මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනමට ලක් වූ සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 18 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණයවල වටිනාකම රු.3,001,480 ක් වූ අතර එම ණය ශේෂය තුල වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින සේවක ණයවල වටිනාකම රු.1,413,451 ක් විය.	2024 දෙසැම්බර් 31 දින වන විට මිය ගිය, විශ්‍රාම ගිය,වැඩ තහනමට ලක් වූ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් රජයට අය විය යුතු ණය ශේෂවල වටිනාකම රු.3,001,480ක් බව.	- එම -

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව ලඟාකර ගත යුතු අරමුණු හා ඉලක්ක කරා ලගාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂාවේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂය තුලදී ඒ පිළිබඳ නිසි අවධානය යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර, වර්ෂය තුල තිරසර සංවර්ධන අරමුණු 01 ක් පමණක් හඳුනාගෙන තිබුණි	මොණරාගල දිස්ත්‍රික්කයට අදාල කරගත හැකි තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඇති බව.	තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණුද හඳුනාගනිමින් ඒවා ලඟා කර ගත හැකි පරිදි වාර්ෂික සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු ලගාකර ගැනීමේ යටතේ සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම යන අරමුණෙහි ප්‍රගතිය සියයට සියයක් බවට දක්වා තිබුණ ද, 2024 වර්ෂයේ අස්වැසුම ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් 54,638 ක් මොනරාගල දිස්ත්‍රික්කය තුළ සිටින බැවින් දුගී බව අවසන් කිරීමේ ප්‍රගතිය සියයට සියයක් ලෙස දැක්වීම නිවැරදි නොවන බවට නිරීක්ෂණය විය.	ප්‍රතිශතය ලෙස දක්වා ඇත්තේ හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම තුලින් සපුරාගත් ඉලක්කයන් වන අතර, ඉදිරියේදී මෙම ගණනය කිරීම් ප්‍රතිලාභීන්ගේ ආර්ථික ශක්තිමත්භාවය පිළිබඳවද සැලකිල්ලට ගෙන කටයුතු කරන බව	නිවැරදි නොවූ දත්ත ඇතුළත් කර වාර්තා සැකසීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, ඉදිරියේදී තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ කාර්යසාධනය නිවැරදිව දැක්විය යුතුය.

6. යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකුගෙන්, සංවර්ධන නිළධාරීන් 05 ක් සහ කලමනාකරණ සේවා නිළධාරීන් 03 කගෙන් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණු අතර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා එක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පමණක් නිකුත් කර තිබුණි.	2024 වර්ෂය තුළ ජාතික මට්ටමේ මැතිවරණ පැවැත්වූ අතර, අභ්‍යන්තර විගණන ශාඛාවේ කාර්ය මණ්ඩලයද මැතිවරණ රාජකාරි සඳහා කැඳවා තිබුණු බව.	අභ්‍යන්තර විගණන ඒකකයෙන් අපේක්ෂිත කාර්යභාරය ඉටු කර නොතිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කිරීමටත්, විධිමත් සැලසුමක් සකසා අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රතිව්‍යුහගත කිරීමත් කළ යුතුය.

7. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්ය මණ්ඩල විස්තරය අනුව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක අනුමත සේවක සංඛ්‍යාවෙන් විධායක ශ්‍රේණියේ තනතුරු 15 ක්, තෘතීයික ශ්‍රේණියේ තනතුරු 14 ක්, ද්විතීයික ශ්‍රේණියේ තනතුරු 119 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 2 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවති අතර ද්විතීයික ශ්‍රේණියේ සේවකයින් 210 ක අතිරික්තයක් විය.	මේ සම්බන්ධයෙන් වන තොරතුරු වාර්ෂිකව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරන බව.	විධිමත් පරිදි කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර පුරප්පාඩු තනතුරු පිරවීමට සහ අතිරික්ත තනතුරු සම්බන්ධව විධිමත් පියවර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම තනතුරේ/ සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු ය. මඩුල්ල, බුත්තල, බඩල්කුඹුර හා වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුක්ත නිලධාරීන් 282 දෙනෙකු 2024 නොවැම්බර් 08 දින වන විට වර්ෂ 06 සිට 31 දක්වා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී සිටින බවට නිරීක්ෂණය විය.	2025 වර්ෂයේදී අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කල අතර, වාර්ෂිකව මෙම ක්‍රියාවලිය විධිමත්ම සිදු කිරීමට කටයුතු කරන බව	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු කර ස්ථානමාරුවීම් ලබාදිය යුතුය.
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක සිටින සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 633 ක් වූ අතර අනුමත සංඛ්‍යාව 452 ක් වූයෙන් සංවර්ධන නිලධාරීන් 181 කගේ අතිරික්තයක් පවතින බවට නිරීක්ෂණය විය. සිටින සංවර්ධන නිලධාරීන් 633 දෙනා සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද වැටුප් වියදම රු.502,527,235 ක් වූයෙන් අතිරික්ත සංවර්ධන නිලධාරීන් සඳහා ගෙවන ලද වැටුප් ඵලදායී නොවන වියදමක් බවට පත්ව තිබුණි.	නව තනතුරු අනුමත සේ සලකා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී තිබූ අතර සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව.	අතිරික්ත සංවර්ධන නිලධාරීන්ගෙන් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට හැකි වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුය.